ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

**ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය 73 වන ඉන්දීය නිදහස් දිනය සමරයි**

ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය 73 වන ඉන්දීය නිදහස් දිනය 2019 සැප්තැම්බර් 1 වන දින කොළඹ, ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති උත්සවයකදී සමරනු ලැබීය. වරාය සහ නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ද ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා සම්භාවනීය අමුත්තා ලෙසද මෙම අවස්ථාවට සහභාගී විය. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්. තුරෙයිරාජා, ශ්‍රී ලංකා - ඉන්දියා සමාජයේ සභාපති ටී. එස්. ප්‍රකාශ්, රාජ්‍යතාන්ත්‍රිකයන්, ක්ෂේත්‍රයේ නායකයන් සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

මෙම අවස්ථාවේ අදහස් දක්වමින් ගරු සාගල රත්නායක මැතිතුමා සියවස් ගණනාවක් පුරා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින සංස්කෘතිමය සබඳතා තුළින් පිළිඹිබු වන සුවිශේෂී බැඳීම, දෙරට අතර සමාන අභිලාෂයන් සහ ජීවන ක්‍රමයන් සිහිපත්

කළේය. දේවානම්පිය තිස්ස රජ සමයේදී මහින්ද මහ රහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවට දායාද කළ , ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට හිමි වූ ශ්‍රේෂ්ඨතම තිළිණය වන බුදු දහම පිළිබඳවද අමාත්‍යතුමා විශේෂයෙන් සඳහන් කළේය. ඉන්දියානු සංවර්ධන සහයෝගිතාවය යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, වතු කම්කරුවන් සඳහා නිවාස 14,000 ක් ඉදිකිරීමට අපේක්ෂා කෙරෙන ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය සහ 1990 සුවසැරිය ගිලන්රථ සේවය වැනි ජනතා කේන්ද්‍රීය විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳවද එතුමා සඳහන් කළේය.

මෙම අවස්ථාව අමතමින් ඉන්දීය මහ කොමසාරිස්තුමා ඉන්දියාවේ මෑතකදී පැවති මහ මැතිවරණය මානව ඉතිහාසය තුළ මෙතෙක් පැවති විශාලතම ප්‍රජාතාන්ත්‍රීය කර්තව්‍යය බවත් එම මැතිවරණයෙන් ඉන්දියාවේ වර්තමාන ප්‍රතිපත්තීන් සහ ස්ථාවරත්වය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා සුවිශාල ජනවරමක් හිමි වූ බවත් ප්‍රකාශ කළේය. නිදහස ලබා ගෙවී ගිය දශක හතක කාලය තුළ ඉන්දියාව අද වන විට ලෝකයේ හොඳම අධ්‍යාපන ආයතන අතර තිබෙන Indian Institute of Technology සහ Indian Institute of Management වැනි අද්විතීය අධ්‍යාපන මධ්‍යස්ථාන රැසක් බිහි කර ඇති බව එතුමා ප් රකාශ කළේය. ඉන්දියාව චන්ද්‍රයා සහ අඟහරු ග්‍රහයා වෙත ගවේෂණ යානා යවා ඇති අතර වර්තමානයේ ජාත්‍යන්තර සහ මූල්‍ය සමාගම් හි ප්‍රධානීත්වය උසුලන පුද්ගලයන් රැසක් නිර්මාණය කර ඇත.

ජිහාඩ් ත්‍රස්තවාදයේ සහාසිකත්වය පාස්කු ඉරු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් ශ්‍රී ලංකාව තුළ හිස එසවූ බව ප්‍රකාශ කළ මහ කොමසාරිස්තුමා එය ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු මානව සංහතියම එකම ජනතාවක් බව විශ්වාස කරන සියලු දෙනාට එරෙහි ප්‍රහාරයක් බව ප්‍රකාශ කළේය. පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණි පළමු විදෙස් රාජ්‍ය නායකයා ඉන්දීය අග්‍රාමාත්‍යතුමා බවත් එතුමාගේ සංචාරයෙන් පිළිඹිබු වූයේ ඉන්දියාව අසීරු අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාව  සමඟ සිටින බවත් යැයි මහ කොමසාරිස්තුමා සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ ශක්තිය, දරා ගැනීමෙ හැකියාව සහ නැවතත් පෙර සේම අභිමානයෙන් නැගී සිටීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව පිළිබඳව ඉන්දියාව තවදුරටත් විශ්වාස කරන බව එතුමා ප්‍රකාශ කළේය. එසේම, ඉන්දීය සංචාරකයන් නැවතත් විශාල වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන බවද ඒ තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයේ සෑම සැපයුම් දාමයක්ම ශක්තිමත් වන බවද මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. එසේම, ඉන්දියානු සමාගම් ශ්‍රී ලංකාවේ පැවැත්වෙන සමුළු සහ ප්‍රදර්ශන සඳහා ඉතා උද්යෝගයෙන් සහභාගී වන බවද ඒ සඳහා සැලකිය යුතු ආයෝජනයන් සිදු කරන බවද එතුමා සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා සහ අවශ්‍යතා මත පදනම්ව ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඉන්දියාව කැප වී සිටින බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. පසුගිය වසර කිහිපය තුළ ටී. එස්. ප්‍රකාශ් මහතාගේ නායකත්වය යටතේ ඉන්දියා - ශ්‍රී

ලංකා සමාජය විවිධ වැඩසටහන් සංවිධානය කරමින් ඉතා සක්‍රීයව කටයුතු කිරීම සම්බන්ධයෙන් මහ කොමසාරිස්තුමා එම සමාජයේ විධායක කමිටුවට සිය ප්‍රශංසාව පළ කළේය.

කොළඹ, ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂ එම්. රාමචන්ද්‍රන් මහතා විසින් රචිත "Ritualistic Visual Traditions: Sri Lanka and Kerala" නමැති ග්‍රන්ථයද මෙම අවස්ථාවේදී එළි දක්වන ලදී.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව නිදහස ලබා කෙටි කලකින් එනම් 1949 වර්ෂයේදී පිහිටුවන ලද ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය ශ්‍රී ලංකාවේ තිබෙන පැරණිතම සහ විශාලතම මිත්‍රත්ව සමාජය වේ.